// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1774/25 – 2012 සැප්තැම්බර් 05 වැනි බදාදා – 2012.09.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: හක්/5/1/1/97.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩපත්තුව සුළු කොට්ඨාසයේ, මුරුතමුරය / බටහිර ගමේ පිහිටි මාතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන සකස් කර ඇති අවසාන ගම් පිඹුර 185 පත්‍ර අංක 17හි කැබලි අංක 259 ලෙස පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0723ක් පමණ වූ අවරියාවත්ත හේන නොහොත් තෙලඹුගහවත්ත හේන නොහොත් පුහුකොස්ගහ හේන අවරියාගහවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

උතුරට සහ නැගෙනහිරට: කැබලි අංක 112; දකුණට: මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: කැබලි අංක 112.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2012 සැප්තැම්බර් මස 17 වැනි දින පෙ.ව. 10.00ට හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 අගෝස්තු මස 28 වන දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මන.

2012 අගෝස්තු මස 29 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

09 – 597